## 06. පශ්චාත් යුධ සමය තුළ වන්නියේ පිබිදීම

මානව පරිණාමය සමග පරිණාමය වූ යුද්ධය සමාජ කණ්ඩායම් අතර, විවිධ ස්වරූපයෙන් දක්නට ලැබෙන අතර එහි සමාජ සංවර්ධනය සඳහා කෘත්‍යාත්මක දායකත්වයට වඩා නිශේධනාත්මක බලපෑම් ප්‍රබල බව නොරහසකි. යුද්ධය මනුෂ්‍යය ඉතිහාසය සහ අත්‍යන්තයෙන්ම බැඳී පවතියි. මානව ඉතිහාසයේ නොදියුණු යැයි සලකන අවධියේ පටන් ම යුද්ධය පැවත ඇත. එය දඩයම් යුගටයත් පෙර සිටම පැවති බව පූර්ව මත විශ්ලේෂකයින් පෙන්වා දෙයි. කෙසේ නමුදු පෘථිවි තලය මත මානව වර්ගයා ඇතුළු සමස්ත ජීව සන්හතිය මුහුණ දෙන දරුණුම ඛේදවාචකය මෙයයි.


සංවර්ධනයේ ප්‍රමුඛතාවය අත්පත් කරගෙන සිටින තාක්‍ෂණය තුළින් ම යුද්ධය නිර්මාණය කරමින් සංවර්ධනය ආපස්සට හැරවීමේ ද්විත්ව කාර්ය තුළ ලෝකයේ ප්‍රබල පසුබෑමක් දක්නට ලැබේ. යුද්ධය හේතුකොටගෙන ලොව පුරා මියයන සංඛ්‍යාව අති විශාලය. ඊට වඩා කිහිප ගුණයක් ආබාධිතයන් බවට පත්වේ. දෙමව්පියන්ට දරුවන් අහිමිව දරුවන්ට දෙමව්පියන් අහිමිව මානව සමාජය විසංවිධානකාරී වීම දක්නට ලැබේ. එපමණක් නොව තමන් ජීවත් වූ ගම්බිම් නිවාස ඒ හා බැඳුණු සම්බන්ධතා සංස්කෘතික පරිසරය බිඳ වැටීම තුළින් සමාජ අපගමනය ඉස්මතු කරයි. මේ සියළු ඛේදවාචකයන් මිනිසාගේම නිර්මාණයයන් ය. වගකිව යුත්තේද

මිනිසාම ය. අමිහිරි අත්දැකීම්වලින් යුක්ත බිහිසුණු යුධ ගැටුම් මානව ඉතිහාසය තුළ දක්නට ලැබුණු අතර ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර යුද්ධය ද මේ අතර වේ.

ශ්‍රී ලංකාව තුළ පැවති තිස් වසරක යුද්ධය මානව කේන්ද්‍රණවාදයට වඩා හුදු එක් ත්‍රස්ත කල්ලියක අවශ්‍යතාවය මත නිර්මාණය වූ බේදවාචකයක් යැයි පැවසීම සාධාරණය. එය සන්නද්ධ ගැටුමක් බවට පත් වූයේ පශ්චාත් කාලීන සමාජ සංස්කෘතිය ප්‍රබල ප්‍රපාතයකට ඇද දමමිණි. දශක තුනකට ආසන්න කාලයක් තුළ සිදුවූ ජීවිත හානි සංඛ්‍යාත්මකව ගණනය කළ හැකි වුවද සමාජ සංස්කෘතිකාංග පසුබෑම සංඛ්‍යාත්මකව ගණනය කළ නොහැකි ය. සන්නද්ධ අරගලයක් ලෙස පැවති යුද්ධය නිරායුධකරණය වූවත් ලෙස සමාජය තුළ දක්නට ලැබුණද යුද්ධය පැවති උතුරු නැගෙනහිර ප්‍රදේශවල ජනතාව යුධ කාලය තුළ වර්ධනය වූ දරිද්‍රතාව හේතුවෙන් තවමත් සමාජ ආර්ථික ගැටළු වලට මුහුණ දෙමින් සිටියි.

ඒ අතර යුධ කලාපීය ජනතාවගේ ගම්බිම් අහිමි වීම ප්‍රබල බේදවාචකයකි. ඒ හේතුවෙන් ඔවුන්ගේ ස්වාධීනත්වය, ග්‍රාමීය සමාජ ව්‍යුහය, එම සම්බන්ධතා ජාලය, සංස්කෘතිය හා බැඳුණු ආගමික සහජීවනය අහිමි විය. තිස් වසරකට ආසන්න කාලයක් මුළුල්ලේ පැවතී යුද්ධය හේතුකොට ගෙන ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනය මන්දගාමී විය. විශේෂයෙන් ගැටුමෙන් හානියට පත් නැගෙනහිර සහ උතුරු පළාත් වල විනාශයට පත් මානව භෞතික පාරිසරක සහ මානසික යන අංශයන්ගෙන් ප්‍රමාණය මැනිය නොහැකි තරම් වන අතර ඒවායේ බලපෑම පරම්පරා ගණනාවක් තිස්සේ පවතිනු ඇත.

මේ තත්ත්වය තුරන් කරමින් දේශපාලන, සමාජ, ආර්ථික, පාරිසරක පුනරුදයක් ඇති කරමින්, බිඳ වැටුණු සමාජය පුනරුත්ථාපනය කල යුතුය.




නැගෙනහිර සහ උතුරු මුදා ගැනීමෙන් පසු මෙම පළාත් දෙක නැවත නගා සිටුවීම සඳහා රජය විසින් විවිධ සැලසුම් සකස් කරන ලදි. මෙම වැඩසටහන් හා රජය හා අනෙකුත් දේශීය විදේශීය අරමුදල් වලින් ක්‍රියාත්මක වන අනෙකුත් වැඩසහන් මගින් ද කෙටි කාලීනව මෙන්ම දිගුකාලීනව තිරසර සංවර්ධනයක් ඇති කිරීමට අවශ්‍ය වටපිටාව සකස් කරමින් සිටියි. එහිදී ආධ්‍යාත්මික, සමාජීය සංවර්ධනය ජීවනෝපාය සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් පුනරුත්ථාපනය සිදුකර ඇත. ආර්ථිකමය පුනරුත්ථාපනයේ දී සමාජය තුළ අන්තර් පුද්ගල බැඳීම් තහවුරු කිරීම අධ්‍යාපන ඉඩ ප්‍රස්ථා විවර කිරීම සිදුකෙරෙයි. මේ අනුව ආර්ථික සමාජීය,

දේශපාලනික පුනරුත්ථාපනය සිදුකරන ආකාරය පැහැදිලි වන අතර යුද්ධය හේතුවෙන් අවතැන් වූවන් නැවත පදිංචි කරලමින් ඔවුන් සඳහා අවශ්‍ය මූලික අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය පරිසරය සකස් කරමින් අදාළ පහසුකම් සැපයීමට සිදුකෙරිණි.

මෙම සංවර්ධන හා පුනරුත්ථාපන ක්‍රියාවලියේ ප්‍රධානතම අරමුණ වන්නේ උතුරත් දකුණත් අසමානතාවයකින් තොරව යා කිරීමයි. ඒ සඳහා විවිධ සංවර්ධන ව්‍යාපෘති රැසක් ආරම්භ කර ඇත. උතුරු නැගෙනහිර සංවර්ධන කටයුතු වලදී පහත සඳහන් අංශ කෙරෙහි අවධානය යොමුකර තිබේ.

- ත්‍රස්තවාදී අරගල හේතු කොටගෙන විනාශ වූ උතුරු හා නැගෙනහිර ප්‍රදේශ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අවශ්‍යය ප්‍රතිපත්ති උපාය මාර්ග හා වැඩසටහන් සම්පාදනය කිරීම.
- උතුරු නැගෙනහිර ප්‍රදේශවල යුද්ධයෙන් අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපනය කිරීම.
- යුධ ගැටුම් හේතුකොට ගෙන ආබාධිත තත්ත්වයට පත්වූ සහ අනාථ වූ තරුණයන් හා කාන්තාවන් පුනරුත්ථාපනය කිරීම සඳහා විශේෂ වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- යුද්ධයෙන් අවතැන් වූ පවුල් සඳහා සහන සේවා සුභසාධනය සහ මානව සංවර්ධන කටයුතු ඉටුකිරිම.
- බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු.
- උතුරු නැගෙනහිර ප්‍රදේශවල විදේශාධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

- ජනතාව වෙනුවෙන් හඳුනාගත් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- විනාශයට පත් වූ මාර්ග, පාලම්, ගොඩනැගිලි විදුලි යෝජනා ක්‍රම මිනිසාගේ පරිහරණයට සුදුසු පරිදි නැවත ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වෙනත් රේඛීය අමාත්‍යාංශ වලින් කෙරෙන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.
- උතුරු නැගෙනහිර ප්‍රදේශවල නිෂ්පාදන දිරිගැන්වීම (කාර්ය සාධනය, 2008, පි. අ. 02)

මෙම සංවර්ධන හා පුනරුත්ථාපන වැඩසටහන් මගින් පැහැදිලි වෙනසක් පශ්චාත් යුධ කලාපවල ඇති කරන ලදි. මේ අනුව අවතැන් වූ ජනතාවගේ අවශ්‍යතාවයන් සහ ඔවුන්ගේ ජීවිත කටයුතු පහසු කිරීම සදහා මාර්ග සංවර්ධන, සෞඛ්‍ය, ආරක්ෂාව, අධ්‍යාපනය, ජලය හා සනීපාරක්ෂක පහසුකම් ජීවනෝපාය මාර්ග සංවර්ධනය සිදුකර ඇති අතර එහි ප්‍රතිඵල සමස්ත සමාජයම භුක්ති විදිමින් සිටියි.

### පශ්චාත් යුධ සමය තුළ පුද්ගලයින් නැවත පදිංචිය

යුද්ධයක් හෝ වෙනත් ආපදාවක් හේතුකොටගෙන අවතැන් වූ පුද්ගලයින්ගේ මූලික අයිතිවාසිකම් තහවුරු කරමින් එම පුද්ගලයින්ට ගෞරවනීය හා සුරක්ෂිත සමාජ ආර්ථික දේශපාලන පරිසරයක් නිර්මාණය කරමින් ඔවුන් මුල් වාසස්ථාන වල හෝ ඔවුන් කැමති විකල්ප ස්ථාන වල පදිංචි කරලීම නැවත පදිංචි කිරීමේ ක්‍රමවේදය තුළ සිදුවේ. මෙය පුනරුත්ථාපනයේ එක් අදියරකි. හානියට පත් දේපල වල මුල් අයිතිකරුවනගේ කුලී නිවැසියන්ගේ,

අයිතීන් ආරක්ෂා කරමින් අවතැන් වූ ජනතාව නැවත පදිංචි කරලීම හා ඔවුන් සමාජීය වශයෙන් නංවාලීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරලීම මෙහිදි සිදුවේ.එහි ප්‍රධාන අරමුණු ලෙස,

- රට අභ්‍යන්තරයේ අවතැන් වූ තැනැත්තන් සහ සරණාගතයින් ආරක්ෂිත සහ ගෞරවනීය ආකාරයෙන් නැවත පදිංචි කිරීම හෝ අලුතින් පදිංචි කරලීම තහවුරු කරලිම.
- රට අභ්‍යන්තරයේ අවතැන් වූ තැනැත්තන් සහ සරණාගතයින් සංවර්ධන ක්‍රියාවලියට ඇතුළත් කරගැනීමට පහසුකම් සැලැස්වීම මගින් ඔවුන් පුනරුත්ථාපනය කිරීමට සහ ඔවුන්ට සහය ලබාදීම පිණිස සම තැනැත්තන් නැවත පදිංචි කීරීම සහ අලුතින් පදිංචි කරලීම පහසු කිරීම.
- පුද්ගලයින් අවතැන් වීම වැලැක්වීම සඳහා අවැසි සම්පත් සහ බලය සහිත විවිධාකාර ආයතනයන්ගේ ප්‍රයත්නයන් සම්බන්ධීකරණය කිරීම.
- අධ්‍යාපනය, සෞඛ්‍යය, නිවාස පහසුකම් සැලසීම මූලික මානව අයිතිවාසිකම් තහවුරු කිරීම ජීවනෝපාය මාර්ග සැලසීම හා බිම බෝම්බ හා සුන්බුන් ඉවත් කිරීම තුළින් නැවත පදිංචි කරලීමේ කාර්ය පහසු කරලීම වැනි කාර්යයන් සඳහා ව්‍යාපෘති හා වැඩසටහන් සම්පාදනය කිරීම ක්‍රියාත්මක කිරීම. (කාර්ය සාධනය, 2009, පි. අ. 13)

උක්ත අරමුණු අනුව පැහැදිලි වන්නේ පුද්ගලයින් නැවත පදිංචි කරලීමට පෙර ඊට අවශ්‍ය පරිසරය භෞතික හා සමාජීය ලෙස සකස්

කලයුතු බවයි. ඒ තුළ ඔවුන්ට සාමාන්‍ය සමාජයේ පුද්ගලයෙකු ලබන සියලු වරප්‍රසාද හිමිවිය යුතුය.

| පළාත | දිස්ත්‍රික්කය | නැවත පදිංචි කිරීම | |
|---|---|---|---|
| | | පවුල් සංඛ්‍යාව | පුද්ගලයින් සංඛ්‍යාව |
| උතුරු පළාත | යාපනය | 31188 | 97052 |
| | මන්නාරම | 24121 | 91178 |
| | වවුනියාව | 15905 | 54107 |
| | මුලතිව් | 39913 | 127892 |
| | කිලිනොච්චි | 40629 | 131465 |
| නැගෙනහිර පළාත | අම්පාර | 337 | 11751 |
| | මඩකලපුව | 37273 | 126766 |
| | ත්‍රිකුණාමලය | 35377 | 129097 |
| | එකතුව | 224743 | 758729 |

(කාර්ය සාධනය, 2013, පි. අ. 31, 32)

නැවත පදිංචි කිරීමේ අධිකාරියේ වැඩසටහන් සමග ඒකාබද්ධව නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ජාතික ව්‍යාපාති සඳහා වු කාර්යාලය මගින් අවතැන් වූ ජනතාව වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටුකරන ලදි. උතුරු නැගෙනහිර ප්‍රදේශ සලකා බැලීමේදී පශ්චාත් යුද සමය තුළ මේ වනවට නැවත පදිංචි කල පවුල් ගණන ලක්ෂ දෙක ඉක්මවා ඇති අතර පුද්ගලයින්

සංඛ්‍යාව ලක්ෂ අටකට ආසන්නව ඇත. 2013 වනවිට නැවත පදිංචි කිරීමේ ප්‍රගතිය පිළිබඳ සාරාංශය පහත පරිදි දැක්විය හැකිය.

නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය, එම අමාත්‍යාංශයේ කාර්යභාරය නිසි ලෙස ඉටු කරගැනීමට පිහිටුවා ගත් ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය, උතුරු පළාතේ අවතැන් වූ මුස්ලිම් ජනතාව සඳහා වූ ලේකම් කාර්යාලය, පුද්ගලයින් දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය, නැවත පදිංචි කිරීමේ අධිකාරිය අත්‍යවශ්‍ය සේවා ඒකකය, ජාතික ව්‍යාපෘතිය සඳහා වූ කාර්යාලය යන ආයතන හා ත්‍රිවිධ හමුදාව පශ්චාත් යුද සමය තුළ සමාජයේ පුනරුත්ථාපනය සඳහා පදිංචි කිරීමේ කාර්ය සාර්ථකව සිදුකර ඇත.